සන්නස
SANNASA

## අපේ කතාව
**ජයසේන කොඩිතුවක්කු, වත්තල.**

දුටුවන නුඹේ දෑසේ ලියවුන රහස
කුල්මත් කළා සිත මගෙ පෙර නොවු විලස
හමුවුන කෙනෙක් නොවුනත් පෙර කිසි දවස
ලෙන් ගතු වුනා එක කුස නිවුනුන් විලස

අවිහිංසකයි සිනහව වත සරසද්දී
පිරිපුන් බවයි සිරුරේ යන එන විට දී
සිත සනසවයි කිංකිණී ඇගෙ හැඩ වෙද්දී
පෙර පින තමයි සිතුනා මට හමු වෙද්දී

මම දීපංකරේ ඇය සෙයිලමෙ හැදුන
කිම එක් වුනේ සුවඳට සසරේ තිබුන
හැම තින් වෙනස් පරිසරවල අපි හැදුන
එන මුත් තකට තක වාගේ මුණ ගැසුන

පාළුව රජ කරපු මගෙ සිත් අම්බලම
ආදර බසින් සැරසුවෙ ඔබ එකවරම
බාධක අභියෝග හමුවේ නොබියවම
පායන සඳ වුනා මගෙ ලොව නිරතුරුම

දහසක් කම්කටොළු අග හිග කම් මැද්දෙන්
රහසක් නොවෙයි වින්දා දුක් හැම පැත්තෙන්
පහුරක් ලෙසින් පැද යන දහිරිය හබලෙන්
පිටුවක් පෙරළුවා රසවත් දිවි ගමනින්

පිපුනා මල් දෙකක් සුවඳින් පිරුනු හැඩ
දැනුනා ජීවිතේ දරුවන් නොවෙද සැප
උතුරා යන සතුට උන් හින්දම අපට
පිරුනා අපේ හදවත් දිවි තුරාවට

## මඩමෙන් ඇසුනු කවි
**ජයසේන කොඩිතුවක්කු,වත්තල**

හත් අට වතාවක් දවසට කිරි ඉල්ලා
දෙතනේ උරපු හැටි මතකෙට එයි මැවිලා
නැළවුවෙ තොත්තු දී සෙනෙහස පෙන්නාලා
ඉඳහිට වත් ඇවිත් යනවද හිත හදලා

වැහිදා අහස ගොරවන කොට තුරුළු
කරන්
නුඹ නැළවුවේ මම තෙරුවන් ගුණ ගයමින්
බහ තෝරන වියේ අම්මා කියපු හඬින්
ඉඳ හිට වත් ඇවිත් අමතනු පුතුගෙ මුවින්

පොඩි සංදියෙ පටන් නුඹෙ තනි නොතනියට
අම්මා නොවෙද සිටියේ දුක සැප දෙකට
මගෙ පන වගේ මම නුඹ රැක ගත්තාට
ඉඳ හිට වත් ඇවිත් පලයන් දකින්නට

නින්දක් නෑ පුතේ මම රෑ කඳුළු බිබී
සතුටක් නෑ පුතේ එන මග බලමි එබී
තරහක් නෑ පුතේ නාවාත් ඉඩ නොලැබී
වැඩිකල් නේ පුතේ පන නල යයි පිට වී

ඉරණම නුඹට සරදම් කරනව වාගෙයි
දඬුවම එපා ඇය සදහට නුඹෙ බිරිඳ යි
සියළුම දේට හොඳ විසඳුම ඉවසීමයි
ලෝදම අනුව අප වෙන් වී යා යුතුමයි

## මුහුණු පොතේ මකුළු දැලක්
**ආනන්ද ගුණතිලක - හොපර්ස් ක්‍රොසිං**

ඕපාදූප බෙදුවත් ලොව හතර අතේ
හරි බොරු දෙකම අඩු වැඩියෙන් එතැන ඇතේ
සෙත් කවි - වස් කවිද තිබුනත් තිතට තිතේ
හරවත් පුවත් හිඟයක් නැත - මුහුණු පොතේ

වැදගත් කමක් මතු පිට නොම පෙනෙන සුලු
තරමක වීඩියෝවකි මා ළඟදි බැලූ
හද පිරි කුතුහලය සැනෙකින් ඉවත හෙලූ
අරුතක් දැනුනි - මගෙ සිත ගත කරපු ගොලූ

පරිඝණකය නැතත් සැලසුමකට අන්ද
සියළුම රටා නිසි පිළිවෙලකට ඉන්ද
හැම මිම්මක්ම නියමිත තැන් වල රන්ද
වියුවා මකුළුවෙක් උගෙ දැල - මන බන්ද

ගුගල් නැතත් නොගොසින් කිසි කැලෑවක
කේළම් නොම අසා - නොවැටී මුලාවක
ඉගෙනුම නොලැබුවද කිසි තක් සලාවක
උෟ දැල වියයි ආවේනික කලාවක
සිරුරෙන් ඉතාමත් පොඩි තරමකට ඉඳන්
මහ ලොකු ගස් අතර ගැලපෙන තැනක රඳන්
පියඹන පොඩි සතුන් පටලන උගුල හදන්
කල වික්‍රමය පසසන්නට නොමැත වදන්

අදිටන ලොකුයි - ඉවසුම ඉහලම රන්ද
අරමුණ කරා උෟ ගිය පිලිවෙල හින්ද
අපෙ සිත් මෙහෙයවා හරි තැනකට කැන්ද
ආදර්ශයක් ගන්නට බැරිදෝ මන්ද



## ගැමි නිවසක් එදා
**බණ්ඩාර කුමරනායක - වන්ටිර්නා දකුන**

ගල් ගෙඩි තුනක් මැද ඇවිලෙන දර ලිපට
ඉදෙනා හුනු සාලෙ බත මද ගින් දරට
පොල් සම්බෝලෙ උම්බල කඩ කල වමට
ගල් වංගෙඩියෙ කෙටෙනා හැටි යස අගට

දෙපලට ගහපු වහලෙට පොල් අතු සෙවිලි
පොලවට ගෑව ගොම සුවදට නැත. බැනිලි
නැතිවට රශ්නයට කැරකෙන පෙති. විදුලි
සිසිලයි ගතට පවනේ නැල වෙයි පියලි

බරටම නැමුනු කොස් දෙල්ගෙඩි වලට වඩා
බාගෙට ඉදුන කජු පුහුලම් දමයි කඩා
ගහ යට වැටුනු කජු ඇට ගිනි මැලට කඩා
හවසට මිදුලෙ එක් වී රස විදියි දොඩා

මොනරුන් ඇවිත් ගම් බැද්දෙන් වෙල් වලට
වී ඇට උරනවා කුස ගිනි ගත් ලෙසට
ගිරවුන් රංචු ගැහිලා ඇට කන රසට
අවුරුද්දට ගන්න අස්වනු මදි අපට

ගොම්මන් අඳුර ගේ අද්දර සරන පැයේ
සක්මන් කලා කවුරුත් පැල දෙසට රැයේ
ඉක්මන් කරන් කූඩුවෙ පැටවුන්ට බයේ
රෑ මැදිරියන් දල්වපු පහනක්ද තියේ

පහනේ දැල්ල දැක මෙරුවන් හනි හනිකේ
ගමනේ කෙලවරට පැමිනෙයි නොදැන දුකේ
හොල්මන් කතා ඇහුවට රංචුව දුනුකේ
ගුලි උන විදිය මතකයි අම්මාගෙ ඇකේ

ගම්බද සිරිය ලස්සන දැක සැන සෙන්න
කොයිබද පැරණි විසිතුරු නැත දැක ගන්න
යන්නට අතීතෙට සිතුවිලි අමු නන්න
පොල් අතු පැලක් සිතුවිලි දහසක් මැවුන

## යශෝධරා දෝ අම්මා ඒනමුත් තාත්තා අමුත්තෙකි.
**පේමසිරි ගුණතිලක**

උපන් දා සිට හන්ඩන සැම විට හන්ඩ ඇසී තණ කිරෙන් තවනා
මුනින් පෙරලී දනින් දනගා දෙපා සවියෙන් නැගිට වැනෙනා
විටදි නැත අවසර වැටෙන්නට අතක් දී පොලවටත් බණිනා
මවට අප විය අලුත් සම්පත පියාගේ ලොව ඈත් කරනා

සැන්දෑ අහසේ පහන් කිරණින් ලොව තෙමා ලු රිදී ඒලියකි
සොන්දුරු බව දැක අප වඩා ගෙන අපට පෙන්වු සංදත් මාමෙකි
දෑත් දිගු කොට අහසෙ රංදවා ගෙතුල ආවිට කවිය සිහිනෙකි
නින්දෙ ලන්නට ගැයූ දොයි ගී පියාගේ ඇසුරේ නොවූවකි

පාසැලේ දුන් අකුරු මතකය ගෙදර ආවිට නැතිව සිටි විට
පියාගේ සැර වැරෙන් විමසුම දුක් කංදුළු යට තද කරන් සිට
පසුවදාටත් ඒසේ වන්නට ඉඩ නොදී ගෙන ඒබර කර පිට
ගෙදර ඇති අන් සුමේ අසලක කරුණු පහදා දුන් වදන් මිට

තුරුනු විය හා ළංගට ලංවුනු සිතේ ගොලුවූ පේරේම අන්දර
කියන්නට අන් කෙනෙක් නැති විට කතා බැහැරින් අසා සිර කර
පියා කන අග පතිත වූ විට ආනිසංශය යක්ෂ සැර බැර
තුනී වන්නට කරුනු පහදා දුන්නු ආසිරි පෙමට හිතකර

විවාහයකින් ගෙදර හැරදා කිංදුරු සෙවනට ගොසින් අද්දර
ලැබූ දරුවන් හදා වැඩුමට පැමිණ හින්ද යයි වුනත් කරදර
පියා ඒන මුත් කිව්ව පමණින් අවැසි විට යුතුකම් පසක්කර
අමුත්තෙක් වෙයි බැංදුම් ආදර යශෝදර මව් ගුණය සමකර

## විශ්‍රාමය
**ජයසේන කොඩිතුවක්කු, වත්තල.**

කාලය ගෙවෙමින් වියපත් වූ තැන
විශ්‍රාමය පෙර පිනක් වගේ
විඩාව දිවි මග නිවා ගන්න මට
ලැබුනු අවසරය කරමි අගේ

දවස පුරා තනිකම හිතවත් වී
සිතුවිලි අතරේ සිර වී
රස මුසු තැන් සිතුවම් කරමින්
සිතින් විඳිමි දැහැනට වී

වැහැරුනත් ගත සිතේ සවි ඇත
ජීවිතේ තව දුර වගේ
වෙන් උවත් සැම එදා ළඟ සිටි
හිතේ සුසුමක් නෑ මගේ

මතකය හිනැහෙයි රැයේ මැදියමේ
සිත් අහසේ තරු මල් සේ
පෙර දා කිසිවක් නොවේ යළිත්
ජීවිතයෙන් දවසක් සේ





# පහන් වැට